# හරාකිරි හෙවත් රට වෙනුවෙන් බඩ කපා ගැනීම

LankaDissent

ගිය සතියේ ලියූ ලිපියට අනුපූරකයක් වශයෙන් ලංකාවේ වමේ ව්‍යාපාරයට සිදු වූ ඇබැද්දිය ගැන යමක් කීමට වුවමනාව තිබුණි. ඒ අතරේ, ගිය සතියේ සබරගමුව සහ උතුරුමැද පළාත් සභා මැතිවරණ ආවේ ය. එහි ප්‍රතිඵලය, ලියන්නට සිතා සිටි ප්‍රස්තුතයට අළුතෙන් අමුද්‍රව්‍ය එකතු කිරීමක් විය.

පළාත් සභා දෙක ම ආණ්ඩුව ජය ගත්තේ ය. ඒ දෙ පළාතේ අඩු වශයෙන් එක මැතිවරණ කොට්ඨාශයක් වත් ජය ගන්නට විරුද්ධ පක්ෂය අසමත් විය. මේ ජය වනාහී 'බඩ පැත්තකින් තබා රට පෙරට ගැනීමක්' වශයෙන් රජය හඳුන්වයි. මා එය දකින්නේ, බඩ පැත්තකින් තබා රට පෙරට ගැනීමකට වඩා, 'රට වෙනුවෙන් බඩ කපා ගැනීමක්' වශයෙනි. ඒ තත්ත්වය අප කවුරුත් වටහා ගනු ඇත්තේ අද නො ව, හෙට ය.

අද (28) ඩේලි මිරර් පත්‍රයේ මත විමසුමකට චන්දය පාවිච්චි කොට එම මත විමසුමේ මුළු ප්‍රතිඵලය දෙස මම බැලුවෙමි. මේ මත විමසුමට ඉදිරිපත් කොට තිබුණු ප්‍රශ්නය (යෝජනාව) වුණේ, මෑතක දී පවත්වන ලද පළාත් සභා චන්දයේ ප්‍රතිඵල වනාහී, (1) ජාතික ප්‍රශ්නයට හමුදාමය විසඳුමක් ඉදිරිපත් කිරීම අනුමත කිරීමක් (2) හමුදා විසඳුමක් වාගේ ම ආර්ථික සංවර්ධනයත් අනුමත කිරීමක් (3) ජනාධිපති රාජපක්ෂ ගේ නායකත්වය අනුමත කිරීමක් (4) ඒ කිසිවක් නො ව, එක්සත් ජාතික පක්ෂය ප්‍රතික්ෂේප කිරීමක් වශයෙනි.

මා චන්දය පාවිච්චි කෙළේ පළමු උත්තරය වෙනුවෙනි. අද (28) වන විට ඊට ලැබී ඇති චන්ද ප්‍රතිශතය සියයට 55.50 කි. දෙ වන උත්තරයට සියයට 9.14 ක් ද, තුන් වන උත්තරයට සියයට 13.11 ක් ද, අවසාන උත්තරයට සියයට 22.25 ක් ද ආදී වශයෙන් ලැබී ඇත. දෙ වන උත්තරය දුන් පිරිසත් හමුදාමය විසඳුම හරි අඩකට බෙදා ඇති නිසා ඉන් අඩක් පළමු උත්තරයට එකතු කළොත්, ජාතික ප්‍රශ්නයට හමුදාමය විසඳුමක් කෙරෙහි මේ පළාත්වල ජනතාව විශ්වාසයක් තබා ඇතැ යි සිතන ජනතාව සියයට 60 ක් ම වන්නේ ය. සත්තකින් ම එම පළාතේ ජනතාව චන්දය පාවිච්චි කෙළේ ඒ අරමුණෙන් නො වුණත්, ඔවුන් එ සේ කෙළේ එම අරමුණින් යැයි මෙ තරම් විශාල පිරිසක් තදින් විශ්වාස කිරීම නො සළකා හැරිය හැක්කක් නො වේ.

මේ වනාහී වර්තමානයේ රටේ පවතින සාමාන්‍ය මනෝ භාවය යි. එය ම,

සම්ප්‍රදායික වමේ ව්‍යාපාරය කෙරෙහි අතීතයේ දී ක්‍රියා කොට ඇත්තේ කෙ සේ ද සහ වර්තමානයේ දී ඕනෑ ම අළුත් වමක් අරභයා විශේෂයෙනුත්, යුද්ධය පිටුදකින ඕනෑ ම ධනපති විකල්පයක් අරභයා පොදුවේත් ක්‍රියාත්මක වනු ඇත්තේ කෙ සේ ද යන්න විමසා බැලීම වටී.

සබරගමුව සහ උතුරුමැද ජනතාවට ප්‍රධාන වුණේ යුද්ධය හමුදාමය වශයෙන් ජයග්‍රහණයක් කරා සේන්දු වනු දැකීම නම්, ඒ අරමුණේ සාර්ථකත්වය වෙනුවෙන් වෙනත් විකල්පයන් ප්‍රතික්ෂේප කිරීමට ඔවුන් පසුබට වී නැති බව අපට උපකල්පනය කළ හැක.

1953 වන විට ලංකාවේ සම්ප්‍රදායික වම සිටියේ එහි ජයග්‍රාහී හිනිපෙත්තේ ය. එහෙත් 1956 වන විට මේ තත්ත්වය කණපිට හැරුණි. 'මගේ සැමියා නො මරා මැරුවේ ඇන්.ඇම්' යැයි සිරිමා බණ්ඩාරනායක මැතිණිය පැවසුවත්, 1956 විසින් සනිටුහන් කරනු ලැබුවේ සම්ප්‍රදායික වමේ පරිහානියේ ආරම්භය යි. එක පැත්තකින් එ තෙක් නො තිබුණු වාමවාදී ධනපති විකල්පයක් (එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක) රටට ලැබුණි. අනිත් අතින් ඒ ධනපති විකල්පය හරහා ජාතික ප්‍රශ්නය මෝදු කොට සිංහල=බෞද්ධ මතවාදය සමාජගත කෙරුණි. මෙය, වම සතුව පැවති කම්කරු ව්‍යාපාරය කෙරෙහි එක සැණින් බලපෑවේ නැති බව සැබෑ ය. පෙර පරිදි ම වෘත්තීය සමිති ව්‍යාපාරය ජවසම්පන්න විය. (සිරිමා මැතිණිය ගේ ප්‍රකාශය අදාළ වන්නේ ඒ අර්ථයෙනුයි). මේ අංශයේ දී, කම්කරුවන් ගේ පංති විඥානය එක පැත්තකිනුත්, අනිත් පැත්තෙන් ආර්ථික ඉල්ලීම් සමග බද්ධ වූ ඔවුන්ගේ භෞතික සැකැස්ම තවත් පැත්තකිනුත්, වමේ ස්වභාවික ආරක්ෂණයන් වශයෙන් තිබුණි. එහෙත් සමාජය තුළ පැවති ජාතික මනෝ භාවයේ අප්‍රසන්න දාහය (ජාතික හැඟීම් සහ මහජාතික=සුළුජාතික දෙ බෙදුම) 1956 සිට හානිකර අන්දමින් මුලින් ම දැනෙන්ට පටන් ගත්තේ සම්ප්‍රදායික වමට යි.

1930 ගණන් සහ 1940 ගණන්වල එන්.එම්. හෝ කොල්වින් සුළු ජාතීන් ගේ අයිතීන් වෙනුවෙන්, විශේෂයෙන් ඔවුන්ගේ භාෂා අයිතිය වෙනුවෙන් බහුතරය අතරේ නැගූ හ’ඩ තව දුරටත් 'අහිංසක' දේශපාලනයක් විදිහට බාර ගැනීමේ හැකියාව, 1956 න් පසු දකුණේ මහජාතිය කෙරෙන් කෙමෙන් තුරන් විය. හේතුව, සිංහල=දෙමළ දෙ බෙදුම, සිංහලයා ගේ පැත්තෙනුත්, දෙමළා ගේ පැත්තෙනුත් මනෝමය තලයක දී ඉදිරි අදියරකට ළඟා වෙමින් තිබුණු බැවිනි. ඒ ඉදිරි අදියර තර්ජනාත්මක විය.

මේ වන විට දෙමළ සමාජය ප්‍රචණ්ඩත්වයට ගොස් නැත. සිංහල සමාජය ගමන් කරමින් සිටියේ, දෙමළාට කිසිවක් දීමට සූදානම් නැති පිළිවෙතක ය. සිංහල සමාජයේ ඒ දරදඬු පිළිවෙත රැකුල් දුන්නේ සම්ප්‍රදායික දෙමළ දේශපාලන නායකත්වය දෙමළ ජනතාව අතරේ අවලංගු කාසියක් කිරීමට ය. ඒ අනුව, මේ සිංහල මනෝ භාවය විසින් ඉටු කරනු ලැබුවේ දකුණේ වම අවලංගු කරන අතරේ උතුරේ තරුණ කැරලිකාරීත්වය ජනිත කිරීම යි.

බණ්ඩාරනායක=චෙල්වනායගම් ගිවිසුම සාර්ථක කර ගැනීමට සිංහල සමාජයට හැකි විණි නම්, තව දශක ගණනාවකට සම්ප්‍රදායික දෙමළ නායකත්වය පවත්වා ගැනීමට හැකියාව තිබිණැ යි මම සිතමි. ගිවිසුම අසාර්ථක වීම දෙමළ ජනතාව අතර තමන් ගේ නායකත්වය පිළිබඳ ඇති කෙළේ කළකිරීමකි. ඊ ළඟට, නැවත

වතාවත් ඩඩ්ලි=චෙල්වනායගම් ගිවිසුම අසාර්ථක වන විට තව දුරටත් පැරණි දෙමළ නායකත්වය බාර ගැනීමට සූදානම් නැති කැරලිකාරී තරුණ දෙමළ පරම්පරාවක බීජ රෝපණයට උතුරු නැගෙනහිර සරු බිමක් බවට පෙරැළිණ.

මේ කාසියේ ම අනිත් පැත්ත වන්නේ, ඉහත කී ගිවිසුම් සම්බන්ධයෙන් සිංහල

බෞද්ධ ජනතාව අතර ඇති කෙරුණු ජාතියේ අනාගත අවදානම පිළිබඳ අනියත භීතිය යි. මුල සිට ම ජාතීන් අතර සමානාත්මතාවය උදෙසා පෙනී සිටි සමසමාජ=කොමියුනිස්ට් දේශපාලනයට 1956 න් පසු ඉස්සර මෙන් දෙමළා වෙනුවෙන් පෙනී සිටීම පහසු නො වි ය. වමේ නායකත්වය ධනපති සභාග දේශපාලනයට යන්නේ හුදෙක් අවස්ථාවාදය සහ බල ලෝභය උඩ නො ව, බහුතරයේ මහජාතික අභිලාෂයන් විසින් ඔවුන් වෙත ඇති කරන ලද මේ නො දුරිය හැකි තෙරපීම ද මත ය.

ඒ ආකාරයෙන් එ දා වම අවලංගු කළ සිංහල ජාතික අභිලාෂය අද සබරගමුවට සහ උතුරුමැදට එන විට දී, ජාතිය නියෝජනය කිරීම ප්‍රතික්ෂේප කරන ධනපති විකල්පයකට වත් (යූ.එන්.පී) ඉඩක් ඉතිරි නො කිරීමට සමත් වී ඇත. එහි අරුත වන්නේ, ධනපති සංවර්ධනය සඳහා පවා ජාතිකත්වය නැවත අර්ථ දැක්විය යුතු ව ඇති බව යි.

එය සිදු විය හැක්කේ එක කොන්දේසියක් යටතේ පමණි. එ නම්, සිංහල=බෞද්ධ චින්තනය තුළ යුද්ධය විසින් වර්තමානයේ පවරාගෙන ඇති අධිකාරී

වරප්‍රසාදිත තත්ත්වය, යුද්ධයේ තර්කනය විසින් හෝ බුද්ධියේ පරීක්ෂාව විසින් අවලංගු වුවහොත් ය.